චක්‍රලේඛ අංක :-05/201 2

මගේ අංකය :- ඩබ්/8/නි.නි/2011
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.

2012-01-18

සියළුම බන්ධනාගාර අධිකාරින් සහ

සහකාර බන්ධනාගාර අධිකාරින් වෙත,

## සිරකරුවන් නිවාස නිවාඩු යැවීම.

උක්ත කරුණට අදාලව නිකුත් කර ඇති බන්ධනාගාර කොමසාරිස් අංක කේ.04/නි.නි/ හා 1974-05-16 දිනැති අංක 622 චක්‍රලේඛය පහත සඳහන් පරිදි සංශෝධනය කරමි.

1. මින් ඉදිරියට සිරකරුවන් නිවාස නිවාඩු යැවීම සිදු කෙරෙනුයේ මගේ අංකඃ- ඩබ්/8/බලපත්‍ර හා 2011.12.05 දිනැතිව නිකුත් කර ඇති අංක 25/2011 දරණ එකී චක්‍රලේඛයේ කොන්දේසි වලට යටත්ව බලපත්‍ර මත මුදාහැරීමට සුදුසුකම් ලබන සිරකරුවන් පමණි.

2. නිවාස නිවාඩු යැවීමේදී පහත සඳහන් පරිදි ක්‍රියාකරන ලෙසට ගරු පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා නියෝග කර ඇති බව එම අමාත්‍යාංශ ලේකම් අංකඃ- MRPR/3/2/CB/2011 හා 2011-08-11 දිනැති ලිපියෙන් දැනුම් දී ඇති බැවින් එපරිදි කටයුතු කරන ලෙසට දන්වමි.

   1) සිරකරුවන්ගේ යහපත් හැසිරීම හා ක්‍රියාකාරිත්වය මත පළමු වරට දින 07 ක නිවාස නිවාඩු ලබාදීම.
   11) ඔවුන්ගේ හැසිරීම හා කල්ක්‍රියාව මත ලබාදෙන නැවත නිවාස නිවාඩුව දින 10 ක් දක්වා දීර්ඝ කිරීම.
   111) පළමු හා දෙවන නිවාස නිවාඩු යහපත් ලෙස ගත කර ඇති සිරකරුවන්ගේ යහපත් හැසිරීම් සලකා බලා තෙවන වර හා ඉන් ඔබ්බට දින 14 දක්වා නිවාස නිවාඩුවක් ලබාදීම.

3. නිවාස නිවාඩු යැවීමට සුදුසුකම් ලැබීමෙන් අනතුරුව ඔවුන් නිවාස නිවාඩු යැවීම සඳහා අවශ්‍ය නිර්දේශය සපයනු ලබන්නේ මගේ අංකඃ- ඩබ්/8/2011 හා 2011-12-05 දිනැති අංක 26/2011 චක්‍රලේඛයේ 2 වගන්තිය පරිදි පිහිටුවනු ලබන සිරකරුවන් නිවාස නිවාඩු යැවීමේ අධීක්ෂණ කමිටුව විසිනි.

4. සිරකරුවන් නිවාස නිවාඩු යැවීමට නිර්දේශ කිරීමේදී ඔවුන්ගේ යහපත් කල්ක්‍රියාව මෙන්ම නේවාසික කාලය තුළ දහම් පාසැල් අධ්‍යාපනය ලැබීම හා ආගමික කටයුතු වල නිරත වීම සහ අනෙකුත් පුනරුත්ථාපන වැඩසටහන් වල නිරත වීම පිළිබඳව ඔබ පෞද්ගලිකවම අධීක්ෂණය කළ යුතුය.

5. ඉදිරි නිවාස නිවාඩු යැවීම් වලදී අදාළ සිරකරුගේ පවුලේ ළඟම ඥාතියා හෝ එසේ ඥාතියෙකු නොමැති නම් භාරකරු ගෙන්වා භාරදීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

6. සිරකරුගේ නිවාස නිවාඩු ගත කිරීම සම්බන්ධයෙන් සුභසාධක නිලධාරී විසින් ඉදිරිපත් කරන ක්ෂේත්‍ර විමර්ශන වාර්තාව සත්‍යවුත්, සාර්ථකවුත් වාර්තාවක් විය යුතුය. මෙහිදී සිරකරු නිවාස නිවාඩු කාලය ගත කළ ආකාරය පිළිබඳව ක්ෂේත්‍රයේදී විමර්ශනය කරන අවස්ථාවේදී හැකිපමණ ග්‍රාමනිලධාරී හමුවීමට කටයුතු කළ යුතු අතර ග්‍රාමයේ වෙනත් ප්‍රභූවරුන්ද හමුවී පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට සුභසාධක නිලධාරීන් වගබලා ගත යුතුවේ. සාවද්‍ය තොරතුරු ඇතුළත් වාර්තා ඉදිරිපත් කරන සුභසාධක නිලධාරීන්ට විරුද්ධව විනයානුකූලව කටයුතු කරනු ලැබේ. තොරතුරු මූලාශ්‍රවල විස්තර පැහැදිලිව වාර්තාවේ සටහන් කළ යුතුය.

7. සංශෝධිත නිවාස නිවාඩු අයදුම්පත්‍රයේ පිටපතක් ඔබගේ ඉදිරි කටයුතුවල පහසුව සඳහා මේ සමඟ අමුණා එවන ( ඇමුණුම 1) බවද කාරුණිකව දන්වමි.

8. නිවාස නිවාඩු නිර්දේශිත සෑම ලේඛනයක් සෑම බන්ධනාගාරයකම ප්‍රසිද්ධ ස්ථානයක සවිකරන ලද දැන්වීම් පුවරුවක දින 7ක් ප්‍රදර්ශනය කල යුතු අතර විරෝධතා හෝ පැමිනිලි ඇත්නම් ඒ පිළිබඳව වාර්තාකල යුතුය.

පී. ඩබ්ලිව්. කොඩිප්පිලි.
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්.

ඇමුණුම 01

# නිවාස නිවාඩු අයදුම් පත්‍රය

01. ආයතනය :
02. සිරකරුගේ නම,අංකය හා ස්ථිර ලිපිනය :
03. සම්පූර්ණ දඬුවම් කාලය :
04. පොලිස් අධීක්ෂණ කාලය :
05. දඬුවම ක්‍රියාත්මක වූ දිනය :
06. සමාව සහිතව නිදහස් වන දිනය :
07. බලපත්‍රමත නිදහස්වීමට සුදුසුකම් ලබන දිනය :
08. වරද (දඬුවම් වගන්තිය සහිතව) :
09. නඩු අංකය (අභියාචනා අංක ද සහිතව) :
10. වැඩ අංශය :
11. ශ්‍රේණිය :
12. බන්ධනාගාර චෝදනා හා දඬුවම් (ඇත/නැත) :
ඇත්නම් ඒ පිළිබඳ විස්තර :
13. ඇතුලත ස්වේච්ඡා වැඩ :
14. ආයතනයේ හෝ පිටස්තර වැඩ සඳහා යොදවා ඇත්ද? :
15. නිවාස නිවාඩු ගත කරන කාලය තුළ සිරකරු භාරගන්නා :
අයගේ නම,ජාතික හැඳුනුම්පත් අංකය සහ ලිපිනය
(ලිපිනය සොයා ගත හැකි පරිදි පැහැදිලිව සටහන් විය යුතුයි)
16. ඔවුන්ගේ ඥාති සම්බන්ධය, නම හා ජාතික හැඳුනුම්පත් අංකය :
17. විවාහක/ අවිවාහක බව :
(විවාහක නම් කලත්‍රයාගේ නම සහ ලිපිනය)
18. මීට ඉහත නිවාස නිවාඩු ගොස් ඇත්නම් වාර ගණන :
19. එළිමහන් සිර කඳවුරක සිටිනම් ඇතුලත් කළ දිනය :
20. සකස් කරන ලද සුභසාධක නිලධාරීගේ නම හා අත්සන :
21. පරීක්ෂා කරන ලද නිලධාරීගේ නම,තනතුර හා අත්සන :
22. නිවාස නිවාඩු මණ්ඩලය රැස්වූ දිනය :
23. නිවාස නිවාඩු මණ්ඩලයේ නිර්දේශය :
(නිර්දේශයේ පිටපතක් ඇමිණිය යුතුයි)
24. නිර්දේශ කරන ලද දින ගණන :

නිවාස නිවාඩු මණ්ඩලයේ නිර්දේශයට මමද එකඟ වෙමි/නොවෙමි.

..........................................

දිනය : ..........................................

බන්ධනාගාර අධිකාරි